ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
உள்நாட்டுத் தொழிற்பாடுகள் திணைக்களம்
Domestic Operations Department

**මෙහෙයුම් උපදෙස් අංක : 35/01/005/0007/10**

2018 සැප්තැම්බර් 19

**සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත,**

**සංචිත අවශ්‍යතා**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් නීති පනත (ලංකා නීති ප්‍රඥප්තියේ 422 වන අධිකාරිය) සංශෝධිත පරිදි 10(ඇ), 93, 94, 96 සහ 97 වැනි වගන්ති යටතේ 2018 සැප්තැම්බර් 19 දින අංක 2089/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද (ඇ) නිවේදනය සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

(අ) ඉහත සඳහන් නිවේදනය ප්‍රකාර බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මෙහි දන්වා ඇති පරිදි අවම සංචිත අගයයන් පවත්වා ගත යුතුය.

(i) 2018 සැප්තැම්බර් 19 දින චක්‍රලේඛ අංක 35/01/005/0010/20 දරන "ණයවර ලිපි මත මෝටර් රථ ආනයනයේ දී සියයට සියයක (100%) ආන්තික අවශ්‍යතාවන්

සහ

(ii) ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වන සමස්ත අනෙකුත් තැන්පතු වගකීම්වලින් සියයට හතයි දශම පහක (7.5%) ප්‍රමාණය

(ආ) 2013 අප්‍රේල් 22 වැනි දින මෙහෙයුම් උපදෙස් අංක 35/01/005/0007/06 හි (අ) උපලේඛනය, මෙහි අමුණා ඇති (අ) උපලේඛනය ලෙස ප්‍රතිෂ්ඨාපනය වේ.

ඉහත සංශෝධනය 2018 ඔක්තෝබර් 16 සිට බලපැවැත්වෙනු ඇත. 2013 අප්‍රේල් 22 දින අංක 35/01/005/0007/06 සහ 35/01/005/0007/07 දරන මෙහෙයුම් උපදෙස්වල අන්තර්ගත අනෙකුත් සියලු උපදේශන තවදුරටත් බලාත්මක වේ.

**සී.ඒ. අබේසිංහ**
**වැ.බ. අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු**

7 වන මහල, 2 වන කුළුණ
අංක 30, ජනාධිපති මාවත
තැ.පෙ. 590, කොළඹ 01, ශ්‍රී ලංකාව

தளம் 7, கோபுரம் 2
இல. 30, சனாதிபதி மாவத்தை
த.பெ 590, கொழும்பு 01, இலங்கை

Level 7, Tower 2
No. 30, Janadhipathi Mawata
P.O. Box 590, Colombo 01, Sri Lanka

+94 112 477036 | +94 112 346287 | ddod@cbsl.lk | www.cbsl.gov.lk

## 'අ' උපලේඛනය

### වාර්තා කිරීමේ ආකෘතිය

### දෛනික තැන්පතු වගකීම් සාමාන්‍යය පිළිබඳ වාර්තාව

බැංකුවේ නම : ..................................................................................

කාල වකවානුව : ........................................................... සිට ................................................................. දක්වා
(දිනය) (දිනය)

වෙත : අධ්‍යක්ෂ,
දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 01.

ඉහත දක්වා ඇති කාලපරිච්ඡේදය තුළ දෛනික ව්‍යාපාර කටයුතු අවසානයේ දී බැංකු පොත්වල දක්වන ලද තැන්පතු වගකීම් හි සාමාන්‍යය පදනම් කොටගෙන සටහන් කරනු ලැබූ ඒවාය.

| (i) | (ii) | (iii) | (iv) |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | කාලීන හා ඉතුරුම් තැන්පතු | ණයවර ලිපි මත ආන්තික අවශ්‍යතාවන් | අනෙකුත් සියලු තැන්පතු වගකීම්[1] |
| | | | |

1.තැන්පතු සහතික සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල විය යුත්තේ ප්‍රකාශ කළ වටිනාකමයි.

## සංචිත අවශ්‍යතා

අදාල කාල පරිච්ඡේදය: ..........................................................................................................

| | අයිතමය | අගය ශ්‍රී ලංකා රුපියල්වලින් |
|---|---|---|
| 1. | 2018 සැප්තැම්බර් මස 19 දින අංක 35/01/005/0010/20 දරන ණයවර ලිපි මත මෝටර් රථ ආනයනයේ දී සියයට සියයක (100%) සමස්ත දෛනික ආන්තික අවශ්‍යතාවන්හි සාමාන්‍යය | |
| 2. | ඉහත අංක (1) හැර දෛනික රුපියල් තැන්පතු වගකීම්වල මුළු එකතුවේ සාමාන්‍යයෙන් සියයට 7.5 ක් | |
| 3. | ඉහත (1) සහ (2) මගින් ආවරණය වන තැන්පතු වගකීම්වල සාමාන්‍යයෙන් සියයට 2 ට වඩා වැඩි නමුත් සියයට 4 නො ඉක්මවන ශ්‍රී ලංකාවේ කාසි හා නෝට්ටුවල අගයේ සාමාන්‍යය | |
| 4. | සංචිත නඩත්තු කාලය තුළ පවත්වා ගෙන යා යුතු මුළු සංචිත අවශ්‍යතාව (1 + 2 - 3) | |

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි සහ මෙම බැංකුවේ පොත්වලට අනුකූල බව ද,

ඉහත දක්වන ලද අගයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා නියම කර ඇති රෙගුලාසීන්ට අනුකූල බවද අපි / මම සහතික කරමු / කරමි.

......................                                                                 ..............................................................

දිනය                                                                                                    නිල මුද්‍රාව

සටහන -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හැර වෙනත් ඕනෑම ආයතනයක් විසින් සිදු කරන තැන්පතු සහ ස්ථාන ගත කිරීම්, නියම කර ඇති අනුපාතයන්ට අනුව සංචිත අවශ්‍යතා පවත්වා ගැනීම සඳහා ගිණුම් ගත කළ යුතුය.

(ආ) සියලු අගයයන් ආසන්න රුපියලට දැක්විය යුතුය.